ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1985 අංක 34 දරන
# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 සැප්තැම්බර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 සැප්තැම්බර් මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 30 යි    තැපැල් ගාස්තුව: ශත 60 යි

**1985 අංක 34 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1985 සැප්තැම්බර් මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 72/84.

**1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1985 අංක 34 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. 1979 අංක 49 දරන පනතින් සංශෝධිත, 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— 1958 අංක 4 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන පරිදි අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු සංස්ථාවේ සාමාජිකයන් නව දෙනකු විය යුතුය:—

(අ) වැවිලි, කළමනාකරණය හෝ කම්කරු සම්බන්ධතා පිළිබඳ දැනීමක් ඇති හෝ කාර්මික, මූල්‍ය සහ වාණිජ කාරණා පිළිබඳව විශේෂඥතාවක් ඇති තැනැත්තන් අතුරින් පත් කරනු ලැබිය යුතු සාමාජිකයන් සත් දෙනෙක්;

(ආ) වෘත්තීය සුදුසුකම් ලත් ගණකාධිකාරීවරයකු වූ එක් සාමාජිකයෙක්; සහ

(ඇ) පශ්චාත් උපාධි සුදුසුකම් සහිත අර්ථ ශාස්ත්‍රඥයකු විය යුතු එක් සාමාජිකයෙක්

ඉහත (අ) ඡේදයෙහි සඳහන් සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු, මේ පනතෙහි මින් මතු "නිල සාමාජිකයකු" වශයෙන් හඳුන්වනු ලැබිය යුතු මහා භාණ්ඩාගාරයේ නිලධරයකු විය යුතු ය.".

ඊ085030—6,750 (85/07)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.